නිපුණතාව 08 - සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 8.4 - බදු මූලධර්ම හා බදු වර්ගීකරණය පිළිබඳ ව විමර්ශනය කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරය විශ්ලේෂණය කරයි.

- සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ආණ්ඩුවේ වියදම්,බදු අයකිරීම් සහ ණය ගැනීම් සඳහා වන අදාළ වෙනස්කම් සිදු කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය නම් වේ.
- රාජ්‍ය බදු,රාජ්‍ය වියදම් සහ රාජ්‍ය ණය ප්‍රදාන රාජ්‍ය මූල්‍ය උපකරණ ය.
- රාජ්‍ය අයභාරය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකක් පවතී.එනම්,
  1.බදු ආදායම
  2.බදු නොවන ආදායම

**<u>බදු අයකිරීමේ අරමුණු</u>**

1.ආදායම හා ධනය බෙදීයාමේ විෂමතා අවම කිරීම.
2.කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සම්පත් කළමනාකරණය කිරීම.
3.ඉහළ සමාජ පිරිවැයක් දරන අවගුණ භාණ්ඩ පරිභෝජනය අධෛර්යවත් කිරීම.
4.සමාහාර ඉල්ලුම කෙරෙහි බලපෑම.
5.සමාහාර සැපයුම කෙරෙහි බලපෑම.

**<u>අභ්‍යාස</u>**

1.බදු අය කිරීමේ මූලධර්ම මොනවාද?
2.බදු අය කිරීමේ සාධාරණත්වය යන මූලධර්මය සඳහා ඉටු විය යුතු කොන්දේසි දෙක නම් කර පැහැදිලි කරන්න.
3.සාධාරණ බදු ක්‍රමයක් සඳහා ආර්ථික න්‍යාය තුළ ප්‍රකාශ වී ඇති ප්‍රධාන මූලධර්ම දෙක නම් කර පැහැදිලි කරන්න.